**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**SINHALA**

**සිංහල**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

## අ.පො.ස. (සා / පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) පහත සඳහන් අන්තස්ථාක්ෂරයන්හි ඇතුළත් ස්වර ලියන්න.

ය-

ල-

(ආ) පහත සඳහන් සඤ්ඤක අක්ෂර නිර්මාණය වන්නට බලපෑ නාසික්‍ය අක්ෂර ලියන්න.

ඟ-

ඳ-

II. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එය තෝරා නිදොස් කොට ලියන්න.

නගරෝද්‍යානයේ සෞන්දර්යය නැරඹූ කාන්තාවන්ගේ නෙත් සිත් ප්‍රභෝදවත් විය.

III. පහත සඳහන් පද විසන්ධි කොට ලියා ඒවා අයත් සන්ධි වර්ගය ලියන්න.

(අ) මොහොර (ආ) නියංසාය

IV. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) චිරන්තන (ආ) ප්‍රඥාව

V. පහත සඳහන් පද්‍ය පාඨයෙහි කළු අකුරින් දක්වා ඇති පද කවර ව්‍යාකරණ අංගයකට අයත් දැයි ලියන්න.

"හන්තානට පායන සඳ ලස්සනයි ද <u>කියන්න</u>
මා නොදුටුව ඒ <u>පුරහඳ</u> ඔබට හැකිය දකින්න"

VI. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) සියලු කලාවන්ට අයිති දෙවඟන

(ආ) යහපත් මිත්‍රයා

VII. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පදයක් හා කෘදන්ත පදයක් ලියන්න.

මව්පියන් ඉදිරියේ ඇය රැඟුම් පෑවා ය.

VIII. පහත සඳහන් වචන අතර නොගැළපීමක් ඇත.එය ගැළපෙන සේ නැවත සකස් කර ලියන්න.

(අ) බුදු රශ්මිය (ආ) උද්‍යාන බිම

IX. පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.

පොලීසිය සොරුන් ලුහු බඳිති.

නීතිඥයෝ ගැහැනියක කැඳෙව්වෝය.

X. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා භාවිත වන පොදු ව්‍යවහාර ලියන්න.

(අ) පනිත්තලයා (ආ) ගැදැල්ල ගෑම

2. පහත සඳහන් (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇසුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩුවන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික වන ගහණය දිනෙන් දින අඩු වෙමින් පවතී. අසංවිධිත ආකාරයෙන් මිනිසා පරිසරය පරිහරණය කිරීම මෙයට හේතුව යි. එය සියලු සත්ව ප්‍රජාවගේ ජීවිතවලට තදින්ම බලපෑම් සිදු කරයි.

(ආ) අන්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට බලවත් පහරක් එල්ල විය. අතීත උරුමයන් දැක බලා ගැනීමටත්, ස්වභාව සෞන්දර්යය විඳ ගැනීමටත් බොහෝ සංචාරකයෝ මෙරටට පැමිණෙති. රටේ දළ ජාතික නිෂ්පාදිතයෙන් වැඩි ආදයමක් සංචාරක ව්‍යාපාරය මගින් උපයන බැවින් සංචාරකයන්ගේ හෙට දවස සුරක්ෂිත කළ යුතු ය.

(ඉ) අතීතයේ මෙරට තිබූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය සෑම අතින් ම වාසිදායක විය. ගොවියාගේ ආර්ථිකය මේ ක්‍රමය යටතේ ශක්තිමත් වූ අතර විධිමත් ආහාර රටාවක් එදා තිබුණි. අද ස්වයංපෝෂිත ක්‍රමයෙන් මිදී අවිධිමත් ආහාර රටාවක් පවත්වා ගෙන යන බැවින් බෝ නොවන රෝග ඇතිවීමේ අවදානම වැඩිව ඇත.

(ඊ) වර්තමානයේ අන් කවරදාකට වත් වඩා තාක්ෂණික මෙවලම් භාවිත කරයි. එහි යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල වර්තමානය වන විට අපිත් අත් විඳිමින් සිටින්නෙමු. එබැවින් තාක්ෂණික මෙවලම් මානව සමාජයේ යහපත උදෙසා යොදා ගත යුතු ය.

3. පහත දැක්වෙන පාඨය වචන 55-65 අතර වන සේ සාරාංශ කරන්න.

අධ්‍යාපන ක්‍රියාවලිය පෙරට වඩා බෙහෙවින් සංකීර්ණ වී ඇත. අධ්‍යාපනයේ අරමුණු වෙනස් වී ඇත. අධ්‍යාපනයට සම්බන්ධ වන ගුරු ශිෂ්‍ය ජනගහනය බෙහෙවින් ම වැඩි වී ඇත. එසේ ම නව දැනුම් සම්භාරයක් විශාල වශයෙන් ලොව පුරා ප්‍රචලිතව ඇත. සෑම වසර හතරකට හෝ තුනකට වරක් ලොව පවතින නව දැනුම දෙගුණ තෙගුණ වේ. එසේ ම අධ්‍යාපන ලාභීන්ට වැඩි වේගයකින් හා ප්‍රමාණයකින් නව දැනුම උකහා ගැනීමට සිදු ව ඇත.

වර්තමාන ලෝකයෙහි අධ්‍යාපනය ලබන්නන් වේගයෙන් වෙනස්වන දැනුම ලබා ගැනීමේ අභියෝගයට මුහුණ දී සිටී. එම අභියෝග ජයගන්නට පරිගණකය, පරිලෝකන යන්ත්‍ර, සුහුරු පුවරු, සංයුක්ත තැටි ආදී තාක්ෂණික මෙවලම් බොහෝ උපකාරී වන බව කිව යුතු ය.

එමෙන් ම බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය මගින් ඉතා කුඩාවට දකින රූප සහ චලන දර්ශන විශාල ව දැකීමේ හැකියාව ඇති හෙයින් හා එය පන්ති කාමරයට නැවුම් අත්දැකීමක් එක් කරන නිසා එය වත්මන් පන්ති කාමරය තුළ ආකර්ෂණය වෙමින් පවතී. මෙසේ නවීන මෙවලම් භාවිත කිරීම තුළින් ගුරුවරයාට මෙන් ම ශිෂ්‍යයා ද අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ක්‍රියාශීලීව දායක වනු ඇත. මෙසේ දැනුම පුපුරා යන ලොවක නවීන තාක්ෂණය තුළින් දැනුම් සම්භාරයක් ලබා ගත හැකි වන අතර ම නව ලෝකයට ගැළපෙන පුරවැසියා නිර්මාණය කර ගැනීමට හැකි වනු ඇත. මේ අනුව බලන විට පවතින ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංශෝධනය විය යුතු ය. නැති නම් දැනුම පුපුරා යන ලොවක අප අසරණ වීමට ඉඩ ඇත.

4. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඡන්දස සම්බන්ධයෙන් ලියැවුණු පැරණි ම පොත පිංගල ආචාර්යගේ වෘත්ත රත්නාකරයයි. ඔහු ඔහුගේ ඡන්දස ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ මෙසේ පවසයි. "අක්ඛර නියමෝ ඡන්දස්" කවියක අක්ෂර නියම කිරීම ඡන්දස් බව ඉන් කියැවේ. තව දුරටත් එය පැහැදිලි කළහොත් පදයක අක්ෂරයන්ගේ හෝ මාත්‍රාවන්ගේ හෝ අක්ෂර ගණයන්ගේ සංඛ්‍යා නියමය වශයෙන් දැක්විය හැකි ය. සිංහලයේ සම්මතයට අනුව මාත්‍රා ඡන්දස හා ගණ ඡන්දස නමින් ඡන්දස දෙවර්ගයකි. ගණ ඡන්දස: වර්ණ ඡන්දස හා අක්ෂර ඡන්දං ලෙස සමහරු හඳුන්වති. ඇසිපිය හෙළන්නට ගත වන සුළු කාලය මාත්‍රාවක් ලෙස හැඳින්විය හැකි අතර එබඳු සුළු කාලයකින් උච්චාරණය කළ හැකි හුස්ම අකුරක් එක මාත්‍රාවක් වෙයි. එය ලුහු නමින් හැඳින්වෙන අතර උච්චාරණයේ දී මාත්‍රා දෙකක් වශයෙන් ගන්නා හුස්මය ගුරු වශයෙන් සැලකේ.

1. ඡන්දස යනු කුමක්ද?
2. ඡන්දස සම්බන්ධයෙන් ලිය වී ඇති ග්‍රන්ථය නම් කරන්න.
3. උච්චාරණයේ දී ගතවන්නේ මාත්‍රාවක් නම් එය හඳුන්වන්නේ කෙසේ ද?
4. සිංහලයේ ඡන්දස් ප්‍රභේද දෙක නම් කරන්න.
5. මෙම ඡේදයේ ඇතුළත් රකාරාංශය සහිත වචන දෙකක් ලියන්න.

(ලකුණු 10)

5. ඔබ ප්‍රදේශයේ මාර්ගය දෙපස හා ජල මූලාශ්‍ර වෙත ප්ලාස්ටික්, පොලිතින් වැනි නොදිරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඇති බවත් ඒවා ප්‍රතිචක්‍රීය කිරීමට අවශ්‍ය උපකරණයක් ලබා දීම තුළින් මේ මහා පරිසර හානිය වළකාගත හැකි බවත් මේ සඳහා තම නගරාසන්න ගමක් වන හිඟුරක්ගොඩ කිරිමැටියාන ගමෙහි ම පුද්ගලයෙකු යෙදවිය හැකි බවත් පැහැදිලි කරමින් පොලිතින්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීය කළ හැකි උපකරණයක් ඉල්ලා ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ සම්පත් බණ්ඩාර ලේකම්වරයා යැයි සිතා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාට යවන ලිපිය සකස් කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ඔබ විසින් අලුතින් ආරම්භ කරන ලද සුවඳ විලවුන් හා ආලේපන වර්ග ඇතුළත් වෙළඳසලක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් වශයෙන් පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් සකස් කරන්න. එය ආකර්ෂණීය විය යුතු අතර ස්වභාවික නිෂ්පාදන බවත් මිල පහසු බවත් අවධාරණය කරමින් කලාත්මක භාවයෙන් යුක්ත වෙළඳ දැන්වීමක් සකසන්න.

(ලකුණු 15)

සැකසුම-අමරා විජේසිංහ මිය